**වන සත්ත්ව සංරක්ෂණ අරමුදල - 2019**
**-------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

වන සත්ත්ව සංරක්ෂණ අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | අරමුදලෙහි වැය ලෙජර් පවත්වාගෙන යාම, පොදු ලේජර් පාලනය, පොදු ලෙජරයේ ගිණුම් පවත්වාගෙන යෑම හා තුලනය කිරීම් දුර්වල මට්ටමින් පැවතුණි. | අරමුදලෙහි වැය ලෙජර් පවත්වාගෙන යාම, පොදු ලේජර් පාලනය, පොදු ලෙජරයේ ගිණුම් පවත්වාගෙන යෑම හා තුලනය කරීම නිවැරදිව සිදු කරන ලෙසට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. | පොත් පත් හා ලෙජර් ගිණුම් පවත්වාගෙන යාමේදී නිවැරදි අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දිය යුතුය. |
| (ආ) | අත්තිඩිය රැඳවුම් මධ්‍යස්ථානය වෙත 2018 ජනවාරි 01 දින සිට 2019 ඔක්තොම්බර් 01 දක්වා කාලය තුළ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන | මෙහි දක්වා ඇති පරිදි කල් ඉකුත් වූ ඖෂධ අප භාවිතා නොකරන අතර, එම කල් ඉකුත් වූ ඖෂධ ඉවත් කිරීමට නිතිපතා නිලධාරීන් | නිවැරදි තොග පාලන පද්ධතියක් පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගබඩාවෙන් නිකුත් කළ වටිනාකම රු.466,601 ක් වූ ඖෂධ එම ස්ථානයට ලැබී තිබුණ ද, එම තොග ඖෂධ තොග ලේඛනයේ සටහන් කර නොතිබූ අතර, එම තොග භාවිතා කළ බවට සාක්ෂි නොවීය. | යෙදවීමට කටයුතු කරමි. | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 757 (ආ) 2018 දෙසැම්බර් 31 දිනට සිදු කර තිබූ වාර්.ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්.තා අනුව අත්තිඩිය රුදවුම් මධ්‍යස්ථානයෙහි වටිනාකම රු.758,154 ක් වූ තොග පැවති බව සමීක්ෂණ වාර්.තාවේ දක්වා තිබුණ ද එම සමීක්ෂණයේදී තොග පොතේ ශේෂය සමඟ සැසඳීමක් සිදුකර නොතිබුණි. ඒ අනුව තොග ඌණතා හෝ අතිරික්තතා පවතිද යන්න හඳුනාගෙන නොතිබුණි. | මින් ඉදිරියට මුදල් රෙගුලාසි 757(ආ) ප්‍රකාරව කටයුතු කරන ලෙසට උපදෙස් දීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 757 (ආ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අත්තිඩිය රුදවුම් මධ්‍යස්ථානයෙ විගණිත දින වූ 2019 සැප්තැම්බර් 17 දිනට ශල්‍යාගාරය තුල රු.283,549 ක් වටිනා ඖෂධ පැවති අතර, තොග පොත් අනුව වටිනාකම රු.83,035 ක් වූයෙන් රු.200,514 ක ඌනතාවයක් නිරීක්ෂණය විය. | මෙහි දක්වා ඇති පරිදි කල් ඉකුත් වූ ඖෂධ අප භාවිතා නොකරන අතර, එම කල් ඉකුත් වූ ඖෂධ ඉවත් කිරීමට නිතිපතා නිලධාරීන් යෙදවීමට කටයුතු කරමි. | නිවැරදි තොග පාලන පද්ධතියක් පවත්වාගෙන යා යුතුය. |

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 13 වගන්තිය ප්‍රකාරව දේපල පිරියත උපකරණ පන්ති කාණ්ඩගත කිරීමේදී අස්තිත්වය සතුව ඇති හෝ පවතින වත්කම්වල ඒවායෙහි සමාන ස්වභාවය හෝ ක්‍රියාකාරීත්වයේ සමාන බව පිළිබඳ පදනම් කරගෙන මූල්‍ය වාර්.තාවල හෙළිදරව් කිරීමේ පරමාර්.ථයෙන් බාණ්ඩගත ගතකර දක්වනු ලැබිය යුතුය. එහෙත් ආයතනික ව්‍යුහය වැඩිදියුණු කිරීම ලෙස රු.57,012,696 ක් බණ්ඩගත කිරීමකින් තොරව විවිධ වත්කම් ලෙස දක්වා තිබුණු අතර කාර්.යාල උපකරණ යටතේ රු.1,759,142 ගිනි අවි හා රු.4,477,676 ක පිහිණුම් උපකරණ දක්වා තිබුණි. | ඉදිරියේදී වත්කම් නිවැරදිව බාණ්ඩගත කර ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 2 ප්‍රකාරව මුදල් හා මුදල් සමාන දෑ යන්නට මාස 03 කට අඩු කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් ගැලපිය යුතු වුවත් දින 84 කදී කල්පිරෙන රු.34,466,003 ක භාණ්ඩාගාර බිල්පත් එලෙස දක්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්.ෂය උසාවි දඩ ආදායම රු.50,410,500 ක් වුවද ආදායම් ලෙස රු.85,878,583 ක් දක්වා තිබුණි. ඒ අනුව රු.35,468,083 කින් උසාවි දඩ මුදල් ආදායම වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | උසාවි දඩ මුදල් අයකර ගැනීම නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | සත්ව කුඩු ගිණුම්ගත කිරීමේදී දෙවරක් ගිණුම්ගත වීම හේතුවෙන් ස්ථාවර වත්කම් රු.670,320 කින් හා ක්ෂය රු.16,895 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී සත්ව කුඩු සඳහා වන රු.670,320 ක මුදල සහ ක්ෂය ප්‍රමාණය නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි ගිණුම් තැබීම හා ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්.ෂය අවසනයේදී නිම කර තිබූ රු.67,212,383 ක් වූ කෙරීගෙන යන වැඩ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත හා සංකල්ප රාමුව අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බිල්පත් පොලි ආදායම රු.9,354 ක් වැඩිපුර හා කලින් ලද බිල්පත් ආදායම රු.36,980 ක් අඩුවෙන් ගණනය කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | නිවැරදිව භාණ්ඩාගාර බිල්පත් පොලි ආදායම ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| අවසාන රබර් උණ්ඩ තොගය | 125,812 | තොග සත්‍යාපන ලේඛන | තොග සත්‍යාපන ලේඛන පවත්වාගෙන යනු ලැබේ. | තොග සත්‍යාපන ලේඛන පවත්වාගෙන යා යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2007 ජුනි මස 27 දිනැති හා අංක 2007/01 දරන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අලි සංරක්ෂණ චක්‍රලේඛය | අත්තිඩිය රැඳවුම් මධ්‍යස්ථානය සඳහා ගෙන එන සියළු සතුන්ගේ විස්තර හා ඉන් මුදාහරින ලද, බැහැර කරන ලද සහ මියගිය සතුන්ගේ විස්තර ක්‍රමාණුකූලව ලේඛනගතව තිබිය යුතු වුවත් එම ලේඛන නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. | මෙම මධ්‍යස්ථානය ඉතාමත්ම අඩු සේවක සංඛ්‍යාවක් සහිතව නඩත්තු වන බැවින් දෛනිකව තුවාලවී හමුවන සතුන්ගේ විස්තර ලේඛනගත කිරීමට නොහැකි විය. ඉදිරියේදී නිසි පරිදි ලේඛන නඩත්තු කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1. සහ 4.3.2 වගන්ති | ගිනිහිරිය සංචාරක බංගලාව ඉදි කිරීමේදී ප්‍රසම්පාදනය සූදානම්වීමේ කටයුතු සඳහා භෞතික අවිනිශ්චිතතාවයන් හා මිල විචලනයන් පිළිබඳව ප්‍රතිපාදන ඇතුලත් කරමින් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙළ කර අනුමත කරගත යුතු වුව ද එපරිදි කටයුතු කර නොතිබුණි. | මුළු පිරිවැය ඇස්තමේන්තුව සඳහා අනුමැතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය විසින් ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනතේ 37 වන වගන්තිය | කිරන හෝ මනින උපකරණවල නිවැරදිතාවය මාස දොළහක කාල සීමාව තුල පරීක්ෂකවරයෙකු විසින් සහතික | තරාදිය අලි රැඳවුම් මධ්‍යස්ථානයට ලැබෙන සත්ව ආහාර කිරා බැලීම සඳහා භාවිතා කිරීමේදී මිනුම්වල වෙනසක් සිදුවී නැති බව | 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| කළයුතු වුවද, උඩවලව අලි රැඳවුම් මධ්‍යස්ථානයේ ඇති පාලම් තරාදියෙහි නිවැරදිතාවය 2019 වර්ෂයේදී පරීක්ෂා කර නොතිබුණි. | වාහනවල තාර බර මැනීමෙන් තහවුරුවූ බැවින් එහි නැවත පාඨාංකනය කිරීමක් අත්‍යාවශ්‍ය බවට තහවුරු වී නොතිබිණි. එබැවින් සෑම වර්ෂයකම පරීක්ෂාවන් සිදු නොකරන ලදී. |

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,282,370,046 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,871,142,266 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.588,772,220 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අරමුදලේ ප්‍රධාන ආදායම් සංරචක ලෙස උද්‍යාන පිවිසුම් ගාස්තු රු.229,779,584 කින්, සේවා ගාස්තු රු.29,479,514 කින් හා උද්‍යානවලට වාහන ඇතුලත් කිරීමේ ගාස්තු රු.21,865,304 කින් පහල යාමත් වියදම් සංරචක ලෙස ගමන් වියදම් රු.47,121,612 කින් හා මහජනයාට සතුන්ගෙන් වන හානි සඳහා වන්දි වියදම් රු.65,085,112 කින් ඉහල යාමද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1 හඳුනාගත් පාඩු**

----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන කාර්.යාලයේ දෙවන මහලට කොටසක් එකතු කිරීම සඳහා රු.6,323,500 ක් වූ කොන්ත්‍රාත්තුවට අත්තිකාරම් ලෙස රු.1,264,500 ක ගෙවා තිබුණි. අත්තිකාරම් මුදලින් රු.529,217 ක ඉදිකිරීම් කර තිබුණු අතර ඉතිරි රු.735,283 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද මේ සඳහා ලබා ගෙන තිබූ අත්තිකාරම් සුරක්ෂණයද නිදහස්කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019 ඔක්තෝම්බර් 31 දිනැති අංක වජී/01/08/ඉංජී/01/03/2007/බී/04 දරන ලිපිය මඟින් අවසන් කර තිබුණ ද, ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්.ග ගෙන නොතිබුණි. | කොන්ත්‍රාත්කරු වෙත ගෙවා ඇති අත්තිකාරම් මුදල වෙනුවෙන් තබා ඇති ඇප සුරක්ෂණය ඔහු විසින් ආපසු ලබාගෙන ඇති අතර, ඔහු විසින් සිදුකර ඇති ඇස්තමේන්තු ගත වටිනාකම රු.529,217 ක්ද, එහි අමතර වැඩ වටිනාකම රු.358,929 ක්ද වී ඇත. ඒ අනුව මුළු වැඩ වටිනාකම රු.888,146 කි. හෝර්ටන්තැන්න ගිණිහිරිය සංචාරක බංගලාව අලුත්වැඩියාවද එම කොන්ත්‍රාත්කරු | දෙපාර්තමේන්තුවට සිදු වූ රු.735,283 ක පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | විසින්ම සිදුකර ඇති බැවින් එම රැඳවුම් මුදල් හා ගෙවීමට ඇති බිල්පත්වලින් අදාළ අලාභයන් අය කරනු ලැබේ. | |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උඩවලව අලි රැඳවුම්හලේ උසාවි නියෝග මත රඳවා සිටින අලින් 13 දෙනාගේ ජල අවශ්‍යතා සපුරාලීම සඳහා රු.628,383 ක වියදමක් දරා කුඩා ජල පොකුණක් ඉදිකර තිබුණද ඒවා පිළිසකර කර නොතිබුණි. ඉතිරිවන ආහාර කොටස් පොකුණ තුළ ගොඩගසා තිබුණි. | අලි පංති තුල පවතින පොකුණු මින් වසර 03 ට පෙර 2016 වර්ෂයේදී ඉදිකරන ලද අතර ඉදිකිරීම් කටයුතු ප්‍රධාන කාර්යාලය මඟින් මෙහෙයවන ලදී. ආරම්භයේදී නිසි පරිදි ක්‍රියාත්මක කලද, අලි පැටවුන් විසින් සිදුකරන ලද බිඳ දැමීම හේතුවෙන් පිළිසකර කිරීමට සිදුවී ඇත. නැවත පිළිසකර කිරීමට කටයුතු කරමින් පවති. | ව්‍යාපෘති සැලසුම් කිරීමට පෙර අවශ්‍යතා මත පදනම්ව විධිමත් අධ්‍යයනයක් සිදු කළ යුතුය. |
| (ආ) | හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයේ 2019 ජුනි මස සිදුකරන ලද අලි සංගණනයට අනුව සිටින අලින් සංඛ්‍යාව 09 ක් වුවද ඒ බව නොසලකා අලින් 30 ක් සඳහා ආහාර සැපයුම සිදු කර තිබුණි. ඒ අනුව 2019 ජුලි මාසයේ සිට සැප්තැම්බර් 14 දක්වා වැඩිපුර සතුන් 21 ක් වෙනුවෙන් රු.3,955,245 ක ආහාර සපයා තිබුණි. | හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයේ 2019 ජූනි මාසයේ සිදු කරන ලද සංගණනය නිවැරදි සංගණනයක් නොවීය. එහි දැන් රඳවා සිටින අලින්ට අවශ්‍ය ආහාර ප්‍රමාණයෙන් 25% ක් පමණක් ලබාදී ඇති බැවින් වැඩිපුර සතුන්ට ආහාර ලබා දී ඇතැයි විගණනය මඟින් ඉදිරිපත් කරන තොරතුරු පිළිගත නොහැක. | සතුන් සම්බන්ධව නිරන්තරයෙන් අධීක්ෂණය කළ යුතු බව හා ඒ මත පදනම්ව සත්ව සුබසාධනය සිදුකළ යුතුය. |
| (ඇ) | හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයේ සිටින අලින් සඳහා මිශ්‍ර කොළ සහ කොස් කොළ සැපයීමේදී ගිවිසුම් රහිතව 2018 දෙසැම්බර් 24 දින සිට 2019 මාර්.තු 15 දින දක්වා කාලච්ඡේදය සඳහා රු.5,024,705 ක් සැපයුම්කරුට ගෙවා තිබුණි. | හොරොව්පතාන වන අලි රැඳවුම් මධ්‍යස්ථානයට ආහාර ලබා දීම සඳහා ටෙන්ඩර් පත්‍ර අත්සන් කර ඇත්තේ ජනවාරි මස නොවන බවත් එම නිසා ලබාදුන් ආහාර සඳහා සැපයුම්කරුට ගෙවීම් කර ඇත්තේ ඉහත ගිවිසුම් | සැපයුම්කරුවන් සමඟ ගිවිසුම් අත්සන් කර සේවාව ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අත්සන් කිරීමෙන් පසුව බවත්, ගිවිසුම් අත්සන් කිරීමේ දී පෙරදාතම කරමින් අත්සන් කර නොහැකි බැවින් එසේ අත්සන් කිරීමට සිදුවූ නමුත් මෙහිදී රජයට මූල්‍යමය පාඩුවක් සිදු නොවූ බව වාර්තා කරමි. | |
| (ඈ) | උඩවලව හීලෑ අලි රැඳවුම් මධ්‍යස්ථානයේ අලින් සඳහා 2019 වර්ෂයට ආහාර මිලදී ගැනීමේ ගිවිසුම අනුව දෛනිකව ආහාර අවශ්‍යතාවය සපයා නොතිබූ අවස්ථාවන්වලදී හිඟ සැපයුම සඳහා 2019 ජනවාරි 01 දින සිට 2019 අගෝස්තු 31 දින දක්වා රු.530,828 ක දඩ මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මූලිකවම අලි පැටවුන්ට එක් එක් අවස්ථාවන්හීදී ප්‍රායෝගිකව සපයාගත හැකි වූ උපරිම ආහාර තොගය ලබාදීම සහ ටෙන්ඩර්කරුවන් සමඟ දිරිමත් කරමින් ලාභය පමණක් අරමුණුකර නොගත් තත්වයෙන් උසස් ආහාර ලබා ගැනීම අපේක්ෂාවෙන් කටයුතු කල බව කාරුණිකව සඳහන් කරමි. | ගිවිසුම ප්‍රකාරව අයකර ගත යුතු දඩ මුදල් අය කිරීමට කටයුතු කිරීම. |
| (ඉ) | උඩවලව හීලෑ අලි රැඳවුම් මධ්‍යස්ථානයේ අලින් සඳහා එළවළු සහ පළතුරු දෛනිකව අදාල සැපයුම් සිදු නොකිරීම හේතුවෙන් 2019 ජනවාරි 01 දින සිට 2019 අගෝස්තු 31 දින දක්වා රු. 419,238 ක දඩ මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණන විමසුමේ සඳහන් කාල පරාසය තුලදී ප්‍රමාද ගාස්තු වශයෙන් දඩ අයකර ගත්තේ නම් එම සත්ව ආහාර සැපයුම්කරුවන් ඒ අයුරින් හෝ ආහාර සැපයීම සිදු නොකිරීමට ඉඩ තිබුණි . විගණන පරීක්ෂණයට පෙර ප්‍රමාද වී හෝ රැගෙන එනු ලබන ආහාර සතුන්ගේ කුසගිනි නිවීම සඳහා ලබාදුන් බව පිළිගන්නා අතර ,සැබැවින්ම එහිදී දඩ මුදල් අයකර ගැනීමට කටයුතු සිදු නොකරන ලද්දේ එසේ වුවහොත් එම ආහාර සැපයුම්කරුවන් සත්ව ආහාර ලබාදීම සිදු නොකරන නිසාවෙන් බව නැවත වරක් සඳහන් කරමි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම. |
| (ඊ) | අත්තිඩිය රැඳවුම් මධ්‍යස්ථානයේ සත්ව කුඩු ඉදිකිරීමේදී අනුමත | අනුමත සැලැස්මේ M1 අයිතමය සඳහා වර්ග අඩි 10500 ක් ලෙස | සැලැස්ම මත පදනම්ව ඇස්තමේන්තු |

| | | |
|---|---|---|
| ඉංජිනේරු ඇස්තමේන්තුව අනුව M1 හා M2 අයිතම රු.954,800 කින් අධි ඇස්තමේන්තු වී තිබුණි. M2 අයිතමය සඳහා ගෙවීම් කිරීමේදී රු.101,112 ක මුදල් වැඩිපුර ගෙවා තිබුණු අතර ඒ සඳහා වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ඇස්තමේන්තු කරන ලද්දේ වැඩබිමේ මිණුම් අනුව අවශ්‍ය ප්‍රමානයට වන අතර ,ගොනුවේ ඇතුලත් සැලස්ම ප්‍රමාද දෝෂයකින් වෙනස් කර ඇතුලත් කිරීමට නොහැකි වූ පැරණි සැලසුමට අනුව නොවන බවත් M1 අයිතමය සඳහා ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රමාණය නිවැරදි බවත් දන්වා සිටිමි.<br>M2 අයිතමය සඳහා ද ඇතුළත් කර ඇති දික් අඩි ප්‍රමාණය වැඩ බිමේ මිනුම්වලට අනුව සකස් කරන ලද ඇස්තමේන්තුවම ප්‍රසම්පාදනයට ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු ප්‍රමාණය බව දන්වා සිටිමි. | සැකසීම හා වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රචණ්ඩකාරී අලින් රඳවා තැබීම සඳහා ඉදිකළ හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයට 2015 සැප්තැම්බර් 04 දින සිට 2019 ජුනි 25 දක්වා ප්‍රචණ්ඩකාරී අලින් 51 ක් රඳවා තිබුණද, ඉන් අලින් 12 ක් විවිධ හේතූන් මත මියගොස් තිබුණි. 2019 ජුනි මස පවත්වන ලද අලි සංගණන වාර්.තාවට අනුව අලින් 9 දෙනෙකු සිටින බව දක්වා තිබුණි. අලින් 30 දෙනෙකු සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය. | හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයේ 2015 සැප්තැම්බර් 4 දින සිට 2019 ජුනි 19 දින දක්වා ප්‍රචණ්ඩකාරී අලින් 51 දෙනෙක් රඳවා තිබුණද අලි දොළොස් දෙනෙක් විවිධ හේතු නිසා මියගොස් තිබුණි. 2019 ජුනි 30 වන විට අලි 09 දෙනකු පමණක් සිටින බවට ස්ථිරව තහවුරු කර නොමැත. | සතුන් සම්බන්ධව නිරන්තරයෙන් අධීක්ෂණය කළ යුතු බව හා ඒ මත පදනම්ව සත්ව සුබසාධනය සිදුකළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | උඩවලව ඇත්අතුරු සෙවණෙහි මනා සෞඛ්‍ය තත්ත්වයෙන් සිටින අලි ඇතුන් 12 දෙනෙකු වයස වර්ෂ 06 ඉක්මවා තිබුණි. 2007 ජූනි 27 දිනැති අංක 2007/1 අලි සංරක්ෂණ චක්‍රලේඛ අනුව සතුන් යහපත් සෞඛ්‍ය තත්ත්වයේ සිටී නම් කඩිනමින් කැලයට මුදා හැරිය යුතු වුවත් ඉහත සඳහන් අලි 12 දෙනා නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේ නිදහස් නොකිරීම නිසා රජයට වර්ෂයකට රු.7,299,257 අතිරික්ත පිරිවැයක් ඔවුන්ගේ නඩත්තුව සඳහා වැයවන බවත් නිරීක්ෂණය විය. | පුනරුත්ථාපනය සිදුවන අලි පැටවුන් හැට තුනක් සිටි අතර ඔවුන්ගෙන් දොළොස් දෙනෙකු වයස අවුරුදු 06 ඉක්මවා තිබුණි. මෙම සතුන් පුනරුත්ථාපනය කර නිදහස් කරන සතුන් බැවින් එම චක්‍රලේඛයකට අනුව නිදහස් කළ නොහැක. එබැවින් මේ සඳහා විශේෂ ක්‍රමවේදයක් හඳුන්වා දී ඇති බැවින් එම චක්‍රලේඛය මගින් පෙන්වා දී ඇති කරුණු එම සතුන්ට අදාළ නොවේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අත්තිඩිය පශු වෛද්‍ය කාර්යාලයේ රු.3,380,575 ක වියදමක් දරමින් ඉදි කල වඳුරු කූඩුව නිසි අවශ්‍යතා ඇගයීමකින් තොරව හා අනුමත සැලැස්මකින් පරිබාහිරව ඉදිකර තිබු අතර 2020 ජූනි වන විටත් කූඩුව නිෂ්කාර්යව පැවතුණි. | අත්තිඩියේ පශු වෛද්‍ය රෝහලේ ඉදිකරන ලද වඳුරු කූඩුව අවශ්‍යතා ඇගයීමක් සහිතව සැලසුම් කර ඉදිරිපත් කර ඇති බැවින් එය සැලසුමෙන් පරිබාහිරව ඉදිකර ඇතැයි පැවසීම පිළිගත නොහැක. මෙම ඉදිකරන ලද වඳුරු කූඩුව හුදෙක් තුවාල වූ සතුන් සුව වන තෙක් සුවසේ රඳවා තැබීමට හැකි තාවකාලික රඳවන කූඩුවක් පමණක් වන අතර දීර්ඝකාලීන වඳුරන් රඳවා තබා ගැනීමේ අපේක්ෂාවෙන් ඉදිකරන ලද කූඩුවක් නොවේ. මෙය නිෂ්කාර්ය වියදමක් ලෙස දක්වා තිබුණද එය එම ස්ථානයට සතුන් සංරක්ෂණය වෙනුවෙන් ලැබී ඇති මහඟු වත්කමකි. | කඩිනමින් භූමියෙහි කැලිකසල ඉවත් කර භාවිතයට ගත යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2(ඛ) ප්‍රකාරව උඩවලව හිලෑ අලි රැඳවුම් මධ්‍යස්ථානයෙහි රඳවා සිටින හීලෑ අලින් සඳහා 2019 වර්ෂයට අවශ්‍ය වන ආහාර මිලට ගැනීමේදී "සියලුම ලංසු මිල ගණන් අසාධාරණ ඉහළ මට්ටමක පැවතීම නිසා" සහල් කුඩු සම්බන්ධ ලංසු ප්‍රතික්ෂේප කිරීමට හැකි වුවද, සහල් කුඩු සඳහා වූ ටෙන්ඩරය වෙළඳපොල මිලට වඩා සියයට 50 ක පමණ වැඩි මිලකට පිරිනමා තිබුණි. සහල් සඳහා ලංසුව ප්‍රතික්ෂේප වූ D & C Suppliers ලංසුකරු විසින්ද රු.32 ක මිලක් ඉදිරිපත් කර තිබූ අතර, එසේ තිබියදී නැවත මිල කැඳවීමකින් තොරව එච්.ජී.රේණුකා බණ්ඩාර සැපයුම්කරුගෙන් සහල් කුඩු කිලෝග්‍රෑම් 01 රු.60 කට මිලදී ගැනීම හේතුවෙන් ආසන්න වශයෙන් රු.204,400 ක පාඩුවක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය. | ජාතික තරඟකාරි මිල කැඳවීම් යටතේ මිලගණන් කැඳවා සුදුසුකම් ලැබී අවම/එකම මිල ඉදිරිපත් කල පුද්ගලයාගෙන් සතුන් නිරාහාරව තැබිය නොහැකි නිසා නැවත මිල ගණන් කැඳවීමකින් තොරව මිලදී ගත් බව දන්වමි. ඉදිරියේදී වෙළඳපල මිලට සාපේක්ෂව ටෙන්ඩරය වැඩිනම් නැවත මිල ගණන් කැඳවීමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය අතර රජයට අවම අවාසියක් වන අකාරයට ප්‍රසම්පාදනය සැලසුම් කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 වගන්තිය ප්‍රකාරව වැදගත් අයිතමයන් පිළිබඳව ලංසුකරුවන් විසින් අඩු වටිනාකම් ඉදිරිපත් කර ඇත්නම් එම අවධානම අඩු කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අතිරේක කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීම හෝ අනුප්‍රමාණ විශ්ලේෂණයක් ලබා ගැනීම | මෙම ලංසු ඇගයීමේදී එක් කොන්ත්‍රාත්කරුවෙකු ඉදිරිපත්වීමත් දෙපාර්තමේන්තු ඇස්තමේන්තුවට වඩා කොන්ත්‍රාත් කරුගේ මුදල වැඩි වීමත් හේතුවෙන් රේට විශ්ලේෂණයක් ලබා දී නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

සිදුකළ යුතුය. එහෙත් P&R Construction (Pvt) Ltd ආයතනය විසින් ඉදිරිපත් කළ ප්‍රමාණ පත්‍රයේ සඳහන් අයිතම 07 ක් සඳහා කාර්යසාධන සුරක්ෂණයක් හෝ අනුප්‍රමාණ විශ්ලේෂණයක් ලබාගෙන නොතිබුණි.

**4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.545,146,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ ව්‍යාපෘති 47 ක භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු බව නිරීක්ෂණය විය. | මින් ඉදිරියට ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරන මෙන් අදාළ නිලධාරීන් දැනුවත් කලෙමි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කිරීම. |